සිංහල රීතිය - 1

# සිංහල අක්ෂර මාලාව


දේශමාන්‍ය
සාහිත්‍ය සූරි
සම්මානිත මහාචාර්ය

**ජේ. බී. දිසානායක**

කොළඹ විශ්වවිද්‍යාලය


(C) Sumitha Publishers

සුමිත පොතක්

# සිංහල රීතිය

සමාජය යනු මිනිසුන්ගේ එකතුවකි. සමාජයක යහ පැවැත්ම රඳා පවතින්නේ මූලික කරුණු දෙකක් මත ය. පළමුවැන්න, එහි පවත්නා 'නීති' සමුදාය යි. දෙවැන්න, එහි පවත්නා 'රීති' සමුදාය යි. නීතියක් රීතියක් නැති සමාජය අවුලින් අවුලට පත් වේ. නීති හා රීති අතර පවත්නා මූලික වෙනස්කම් හඳුනා ගැනීම භාෂාවේ ස්වභාවය හඳුනා ගැනීමට මහත් සේ උපකාරී වේ.

විවාහය පිළිබඳව නීති පද්ධතියක් මෙන් ම රීති පද්ධතියක් ද ඇත. විවාහ වන දෙදෙනාගේ වයස් සීමාව ගැන නීතියක් ඇත. විවාහ වන දා මනමාලිය පෝරුවෙහි සිට ගත යුත්තේ කෙසේ ද යන්න ගැන නීතියක් නැත. එහෙත් ඈ සිට ගත යුත්තේ මනමාලයාගේ වම් අත පැත්තෙහි ය යනුවෙන් රීතියක් ඇත. විවාහ වන දාට 'ජය මංගල ගාථා' කියා ආශිර්වාද කළ යුතු යැයි නීතියක් නැතත් රීතියක් ඇත.

නීති හා රීති අතර මූලික වෙනස්කම් තුනක් දක්නට ලැබේ. පළමුවැන්න, නීති හා රීති උපදින ආකාරය යි. නීතියක් උපදින්නේ එය කිසියම් බලධර මණ්ඩලයක් විසින් පනවනු ලැබීමෙනි. මේ බලය බොහෝ විට පැවරෙන්නේ පාර්ලිමේන්තුවට හෙවත් රාජ්‍ය මන්ත්‍රණ සභාවට ය. රීතියක් උපදින්නේ පාර්ලිමේන්තුව වැනි බලධර මණ්ඩලයකින් නොව මුළු මහත් සමාජයෙනි. මඟුල් පෝරුවේ සිරිත් විරිත් සම්මත කොට ගෙන ඇත්තේ ආඥා පනතකින් නොව මුළු මහත් සමාජය විසිනි.

(C) Sumitha Publishers

දෙවැන්න, නීති හා රීති සංග්‍රහ කොට ඇති ආකාරය යි. සමාජයකට බල පාන ඒ ඒ නීති කිසියම් ලේඛනයක සංග්‍රහ කොට ඇත. විවාහයට අදාළ සියලු නීති විවාහ ආඥා පනතෙහි ලේඛනගත කොට ඇත. වගන්ති හා උපවගන්ති වශයෙන් ඒ නීති ඉදිරිපත් කෙරේ. එහෙත් විවාහයට අදාළ සිරිත් විරිත් හෙවත් රීති ඇතුළත් ලේඛනයක් නැත.

තෙවැන්න, නීති හා රීති උල්ලංඝනය කළ විට ඇති වන විපාක යි. නීතියක් බින්ද විට එය දඬුවම් ලැබිය යුතු වරදක් වේ. දඬුවම් පැමිණවීම පොලිසියෙහිත් උසාවියෙහිත් කාර්ය භාරය යි. එහෙත් රීතියක් බිඳුණු විට පොලිසියෙන් හෝ උසාවියෙන් දඬුවම් පැමිණෙන්නේ නැත. මඟුලක් නොකා විවාහයක් කර ගත හොත් ඉන් පොලිසියට ප්‍රශ්නයක් නැතත් සමාජයට ප්‍රශ්නයක් ඇත. එසේ කරන්නට ඇත්තේ ඇයි දැයි සමාජය විමසන්නට පටන් ගනී. ඒ අනුව නොයෙක් කටකතා පැතිර යනු ඇත. එයින් වන අපහාසය උසාවියෙන් ලැබෙන දඬුවමට වඩා බරපතල විය හැකි ය.

භාෂාව සැදී ඇත්තේ නීති පද්ධතියකින් නොව **රීති පද්ධතියකින්** බව අවධාරණය කළ යුතු ය. සිංහලයෙහි අකුරු යෙදිය යුත්තේ මෙසේ යැයි කියා හෝ පද සන්ධි කළ යුත්තේ මෙසේ යැයි කියා හෝ පද හෝ වාක්‍ය සදා ගත යුත්තේ මෙසේ යැයි කියා හෝ නීතියක් නැත. එසේ කළ යුත්තේ අසවල් ආඥා පනතෙහි එන අසවල් වගන්තිය අනුව යැයි කිව නොහේ.

එසේ වුවද නිවැරදිව අකුරු යෙදිය යුතු ආකාරය (අක්ෂර වින්‍යාසය), පද සන්ධි කළ යුතු ආකාරය (අක්ෂර සංයෝගය), පද සදා ගත යුතු ආකාරය (පද සාධනය) හා වාක්‍ය සදා ගත කළ යුතු ආකාරය (වාක්‍ය සාධනය) පිළිබඳව රීති පද්ධතියක් ඇත. මේ රීති පනවන ලද්දේ බලධරයන් විසින් නොව භාෂාව භාවිත කරන්නන් විසිනි.

භාෂාවක භාවිතය අළලා පවතින රීති පද්ධතිය 'ව්‍යාකරණය' නම් වේ. මේ රීති කලින් කලට වෙනස් වෙමින් පරිණාමයට පත් වේ. එබැවින් ඒ ඒ කාල පරිච්ඡේදවල පවත්නා ව්‍යාකරණ රීති කවරේ දැයි ව්‍යවහාරානුසාරයෙන් විමසා බැලීම වාග්විද්‍යඥයාගෙත් ව්‍යාකරණඥයාගෙත් වගකීම වේ.

'සිංහල රීතිය' නමැති මේ පොත් පෙළේ අරමුණ සමකාලීන සමාජයෙහි සිංහල භාෂාව භාවිත වන ආකාරය විද්‍යාත්මකව විමසා බලා ඊට අදාළ රීති සමුදාය කෙබඳු දැයි විධිමත්ව හෙළි පෙහෙළි කිරීම යි. එසේ කිරීමෙන් සමකාලීන සිංහලයන් සිතන පතන ආකාරය හඳුනා ගැනීමට සිංහල පාඨක ලෝකයාට හැකි වනු ඇත.

# පෙර වදන

'සිංහල අක්ෂර මාලාව' නමැති මේ පොත 'සිංහල රීතිය' නමැති පොත් පෙළේ පළමුවැන්න යි. මේ පොතේ අරමුණ සිංහල අක්ෂර මාලාව හඳුන්වා දීම යි. 'අක්ෂර මාලාව' යනු භාෂාවක් ලිවීම පිණිස යොදා ගන්නා රූප හෙවත් සංකේත සමූහය යි. අක්ෂර මාලාවට 'වර්ණ මාලාව' හා 'හෝඩිය' යන නම් ද යෙදේ.

නූතන ලෝකයෙහි ජීව භාෂා දහස් ගණනක් ඇතත් අක්ෂර මාලා ඇත්තේ සීමාසහිත ප්‍රමාණයකි. එයින් එකක් සිංහල අක්ෂර මාලාව යි. ඊට අවුරුදු දෙ දහස් ගණනකටත් වැඩි ඉතිහාසයක් ඇත. එය අඛණ්ඩ ඉතිහාසයක් ද වේ. මුල දී ගල් ලෙන්, ගල් පුවරු හා ගල් ටැම්වල ලියවුණු මේ අක්ෂර කාලයාගේ ඇවෑමෙන් පුස් කොළයටත් කඩදාසියටත් පරිගණකයටත් පිවිසිණ.

භාෂාවේ ස්වාභාවික පරිණාමය නිසා එහි අක්ෂර මාලාව දෙයාකාරයකින් වෙනස් වේ. පළමුවැන්න, අක්ෂරවල හැඩරුව යි. දෙවැන්න, අක්ෂර සංඛ්‍යාව යි. මුල් ම සිංහල අක්ෂර එවක දඹදිව භාවිත වුණු 'බ්‍රාහ්මී අක්ෂර' නමැති අක්ෂරවලට සමාන විය. මුල දී අක්ෂර විසි ගණනකට සීමා වුණු අක්ෂර සංඛ්‍යාව අද වන විට 60 කට ආසන්න ය.

පැරණිතම සිංහල අක්ෂර වන බ්‍රාහ්මී අක්ෂර නූතන සිංහලයෙකුට කියවන්නට බැරි තරමට වෙනස් වී ඇත. මේ වෙනසට හේතු වූයේ ලිවීමට යොදා ගත් ද්‍රව්‍යයත් වෙනත් අක්ෂර මාලාවල බලපෑමත් ය. පරිගණක තාක්ෂණය නිසා සිංහල අක්ෂර තව තවත් හැඩ වෙමින් පවතී. 'ෆොන්ට්' යන නමින් හැඳින්වෙන පරිගණක අක්ෂර සිංහල අක්ෂර මාලාව තව තවත් විසිතුරු කරමින් වැඩේ.

මේ පොතින් සිංහල අක්ෂර මාලාව ඉදිරිපත් කෙරෙන්නේ පියවර කිහිපයකිනි. පළමුවැනි පියවර, එදා සිට අද වන තුරු භාවිත වන විවිධ අක්ෂර මාලා හඳුන්වා දීම යි. සිදත් සඟරා හෝඩිය, අමිශ්‍ර සිංහල හෝඩිය, මිශ්‍ර සිංහල හෝඩිය, ජාතික අධ්‍යාපන ආයතන හෝඩිය හා පරිගණක සිංහල හෝඩිය මේ අතුරෙහි වේ.

දෙවැනි පියවර, අක්ෂර ප්‍රභේද හඳුන්වා දීම යි. විවිධ හේතු සාධක මත සිංහල අක්ෂර නොයෙක් වර්ගවලට වෙන් කරනු ලැබේ. මේ අක්ෂර මූලික වශයෙන් 'ප්‍රාණාක්ෂර' හා 'ගාත්‍රාක්ෂර' යනුවෙන් දෙ වර්ගයකට වෙන් කෙරේ. අනතුරුව ඒ ප්‍රාණාක්ෂර සියල්ල 'කෙටි' හා 'දික්' වශයෙන් ද, 'පූර්ව' හා 'අපර' වශයෙන් ද 'සරල' හා 'සංයුක්ත' වශයෙන් ද 'විවෘත' හා 'සංවෘත' වශයෙන් ද වර්ග කරනු ලැබේ.

ගාත්‍රාක්ෂර සියල්ල ද විවිධ සාධක මත වර්ග කළ හැකි ය. 'ඝෝෂ' හා 'අඝෝෂ' යන නම් ද, 'අල්පප්‍රාණ' හා 'මහාප්‍රාණ' යන නම් ද, 'කණ්ඨජ' 'තාලුජ' 'මූර්ධජ' 'දන්තජ' හා 'ඕෂ්ඨජ' යන නම් ද භාවිත වන්නේ මේ ගාත්‍රාක්ෂර වර්ග හඳුන්වනු පිණිස ය. සිංහල අක්ෂර මාලාව ඇතැම් කරුණු අතින් වෙනත් අක්ෂර මාලාවලට සමාන වන අතර ඇතැම් කරුණු අතින් අසමාන වේ.

සත්වැනි සිය වස වන විට ලෝකයෙහි වෙනත් කිසිදු අක්ෂර මාලාවක නැති 'ඇ' හා 'ඈ' යනුවෙන් ප්‍රාණාක්ෂර දෙකක් ද 'ඟ' 'ඬ' 'ඳ' හා 'ඹ' යනුවෙන් 'සඤ්ඤක අක්ෂර' හතරක් ද නිර්මාණය කර ගැනීමට සිංහල ලේඛකයෝ සමත් වූහ. සිංහල අක්ෂර මාලාව වෙනත් අක්ෂර මාලා කෙරෙහි ද බල පා ඇත. එකොළොස්වැනි සිය වසට කලින් මාලදිවයිනේ භාවිත වුණු 'එවේලා අකුරු' පැරණි සිංහල අකුරුවලට සමාන ය. සියම් හෝඩිය ද සිංහල ලේඛන ක්‍රමයෙන් අභාසය ලබා ඇති බවක් පෙනේ.

**ජේ.බී.දිසානායක**

2 ඒ, පීටර්ස් පෙදෙස
නුගේගොඩ

(C) Sumitha Publishers

# පටුන


1. සිංහල අක්ෂර මාලාව 7
2. සිදත් සඟරා හෝඩිය 8
3. අමිශ්‍ර සිංහල හෝඩිය 10
4. මිශ්‍ර සිංහල හෝඩිය 12
5. ජාතික අධ්‍යාපන ආයතන හෝඩිය 14
6. සමකාලීන සිංහල හෝඩිය 16
7. ජාත්‍යන්තර සිංහල හෝඩිය 18
8. ශබ්ද හා අක්ෂර 20
9. ප්‍රාණාක්ෂර හා ගාත්‍රාක්ෂර 22
10. ඝෝෂ ශබ්ද හා අඝෝෂ ශබ්ද 24
11. ස්වර හා අර්ධ ස්වර 26
12. ව්‍යංජන හා අර්ධ ව්‍යංජන 28
13. අල්පප්‍රාණ අක්ෂර හා මහාප්‍රාණ අක්ෂර 30
14. කෙටි ස්වර හා දික් ස්වර 32
15. පූර්ව ස්වර හා අපර ස්වර 34
16. සරල ස්වර හා සංයුක්ත ස්වර 36
17. විවෘත ස්වර හා සංවෘත ස්වර 38
18. ස්ථානීය වර්ගීකරණය 40
19. විලාසීය වර්ගීකරණය 42
20. කණ්ඨජ අක්ෂර 44
21. තාලුජ අක්ෂර 46
22. මූර්ධජ අක්ෂර 48
23. දන්තජ අක්ෂර 50
24. ඕෂ්ඨජ අක්ෂර 52
25. සිංහල හෝඩියේ නිර්මාණාත්මක ලක්ෂණ 54
26.සඤ්ඤක අක්ෂර 56
27. අකුරුවල හැඩ රුව 58
28. බ්‍රාහ්මී අක්ෂර 60
29.ඉපැරණි මාලදිවයින් හෝඩිය 62
30.සිංහල අකාරාදි පිළිවෙළ 64
31.සිංහල අකුරු සහ සිංහල ඉලක්කම් 66
32. ජාත්‍යන්තර සිංහල හෝඩිය 68


(C) Sumitha Publishers

# 1
# සිංහල අක්ෂර මාලාව

සිංහල භාෂාවෙන් ලිවීම සඳහා යොදා ගනු ලබන රූප සමූහය **'සිංහල අක්ෂර මාලාව'** නම් වේ. ඊට ම **'සිංහල වර්ණ මාලාව'** හා **'හෝඩිය'** යන නම් ද යෙදේ. භාෂාවේ වෙනත් අංග මෙන් ම හෝඩිය ද කලින් කලට පරිණාමයට භාජන වන්නකි. සිංහල හෝඩියෙහි සිදු වුණු එක් වෙනසක් ඊට අයත් අක්ෂර සංඛ්‍යාව හා සම්බන්ධ වේ. අක්ෂර සංඛ්‍යාව අනුව සිංහල හෝඩියෙහි ප්‍රභේද හයකි.

මේ හෝඩි අතුරින් පැරණිතම හෝඩිය **'සිදත් සඟරා හෝඩිය'** නමින් හැඳින්විය හැකි ය. එය සිංහලයෙහි කෙටි ම හෝඩිය ද වේ. ඊට අයත් වන්නේ අකුරු 30 ක් පමණකි. එයින් 10 ක් පණකුරු ද 20 ක් ගතකුරු ද වේ. පැරණි සිංහල සාහිත්‍යකරුවන් පද්‍ය රචනය සඳහා යොදා ගත්තේ මේ හෝඩිය යි.

**'අමිශ්‍ර සිංහල හෝඩිය'** යනුවෙන් හැඳින්වෙන හෝඩියෙහි ඇත්තේ අකුරු 32 කි. සිදත් සඟරා හෝඩියට 'ඇ' හා 'ඈ' යන පණකුරු දෙක ද එකතු කොට ගත් විට මේ හෝඩිය සැදේ. මෙය ද මූලික වශයෙන් පැරණි පද්‍ය සිංහලය සඳහා භාවිත වූවකි. මේ හෝඩියට **'ශුද්ධ සිංහල හෝඩිය'** හා **'නුමුසු එළු හෝඩිය'** යන නම් ද යෙදේ.

**'මිශ්‍ර සිංහල හෝඩිය'** යන නමින් හැඳින්වෙන හෝඩියෙහි ඇත්තේ අකුරු 54 කි. "සිංහලයෙහි අක්ෂර රූප සිවු පනසෙකි" යනුවෙන් කුමාරතුංග මුනිදාස මහතා සිය 'ව්‍යාකරණ විවරණයෙහි' (4 පිට) හඳුන්වා දෙන්නේ මේ හෝඩිය යි. මේ හෝඩිය පද්‍ය රචනය සඳහා පමණක් නොව ගද්‍ය රචනය සඳහා ද යොදා ගනු ලබන්නකි.

**'ජාතික අධ්‍යාපන ආයතන හෝඩිය'** යනු 1989 දී මහරගම පිහිටි ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ අංශය මගින් සම්මත කරන ලද්දකි. මිශ්‍ර සිංහල හෝඩියට 'සඤ්ඤක අක්ෂර' 5 ක් ද ඉංග්‍රීසිය නිසා උපන් 'ෆ' අක්ෂරය ද එකතු වූ විට සැදෙන අකුරු 60 කින් මේ හෝඩිය සමන්විත වේ.

යට දැක්වූ හෝඩිවල එන ඇතැම් අකුරු සමකාලීන සිංහල ලේඛකයන් විසින් භාවිත කරනු නොලැබේ. 'ඉලු යන්න' හා 'ඉලූ යන්න' මෙනි. සමකාලීන සිංහල ලේඛකයන්ගේ ව්‍යවහාරය පාදක කොට ගනිමින් සැදුණු හෝඩියක් **'සමකාලීන සිංහල හෝඩිය'** නමින් මා විසින් 1990 දී යෝජනා කරන ලදි.

සිංහලයට අලුතින් ම එක් වුණු හෝඩිය **'ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානය'** (International Standards Organization) මගින් අනුමත කරන ලද්දකි. මේ හෝඩියෙහි අක්ෂර සංඛ්‍යාව 61 ක් වේ. ජාතික අධ්‍යාපන ආයතන හෝඩියෙහි එන අක්ෂර සංඛ්‍යාවට 'ඥ' අකුර ද එකතු කොට ගැනීමෙන් **'ජාත්‍යන්තර සිංහල හෝඩිය'** සැදේ.

සිංහල හෝඩි පිළිබඳව ද ඒවාට අයත් අක්ෂර පිළිබඳව ද තොරතුරු හෙළි පෙහෙළි කරමින් බසක මහිමය කියා පෑම මේ පොතේ අරමුණ යි.

(C) Sumitha Publishers

# 2
# සිදත් සඟරා හෝඩිය

**'සිදත් සඟරා හෝඩිය'** යනු **'සිදත් සඟරාව'** නම් පොතෙහි දක්වා ඇති අක්ෂර මාලාව යි. දැනට අප අතට පත් වී ඇති පැරණිතම හෝඩිය ද කෙටි ම හෝඩිය ද මෙය යි.

'සිදත් සඟරාව' නම් කෘතිය ලියා ඇත්තේ 'දඹදෙණි යුගයෙහි' දී හෙවත් දහතුන්වන සියවසෙහි දී ය. එහි කතුවරයා පතිරාජ නම් පිරිවෙනක අධිපති පදවිය හෙබවූ භික්ෂූන් වහන්සේ නමක් බව එහි අවසානයෙහි දැක්වෙන දුෂ්කර බන්ධනයෙහි එන 'පතිරජ පිරුවනගෙ සිදත' නම් යෙදුමෙන් හෙළි වේ.

දහතුන්වන සියවසට පෙර ලියවුණු පොතක දැක්වුණු හෝඩියක් අප අතට පත් ව නැති හෙයින් මෙය මෙතෙක් ශේෂ ව පවත්නා පැරණිතම සිංහල හෝඩිය සේ සැලකිය හැකි ය.

හෝඩිය පිළිබඳ තොරතුරු ඇතුළත් වන්නේ සිදත් සඟරාවේ මුල් ම අදියර වන 'සන් අදියරෙහි' ය. එහි දැක්වෙන ආකාරයට 'සිය බසැ වහරට යුහු' අකුරු 30 ක් වේ. ඒ අතුරෙහි පණකුරු දහයක් ද, ගතකුරු විස්සක් ද වේ. මේ අනුව, සිංහල හෝඩි අතුරෙහි කෙටි ම හෝඩිය ද මෙය වේ.

(C) Sumitha Publishers

එහි දැක්වෙන 'දස පණකුරු' මෙසේ ය:

| | |
|---|---|
| අ | ආ |
| ඉ | ඊ |
| උ | ඌ |
| එ | ඒ |
| ඔ | ඕ |

එහි දැක්වෙන 'විසි ගතකුරු' මෙසේ ය:

| | | | |
|---|---|---|---|
| ක | ග | ජ | |
| ට | ඩ | ණ | |
| ත | ද | න | |
| ප | බ | ම | |
| ය | ර | ල | ව |
| ස | හ | ළ | (අ)ං |